# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2319/42 - 2023 පෙබරවාරි මස 14 වැනි අඟහරුවාදා - 2023.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 11/80 (29)

**1980 අංක 26 දරන ආහාර පනත**

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින්, ආහාර උපදේශක කමිටුව විමසා සාදන ලද නියෝග.

**කෙහෙළිය රඹුක්වැල්ල,**
සෞඛ්‍ය අමාත්‍ය.

2023 ජනවාරි මස 27 වන දින,
කොළඹ දීය.

නියෝග

1. මේ නියෝග 2022 ආහාර (සීනි මට්ටම් සඳහා වර්ණ සංකේතවත් කිරීම - දියර) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2024 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මකභාවයට පත්වනු ලැබේ.

2. (1) ක්ෂණිකව පානය කිරීමට හැකි ආකාරයකින් වූ ද, සීනි අන්තර්ගත වූ ද, යම් දියර ආහාරයක් මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් ලේබල් කළ යුතු ය.

1A - PG 6223 — 4506 (2023/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) (අ) යම් දියර ආහාරයක් පරිභෝජනයට පෙර, එකී අහාරයේ බහාලුව මත ඇති ලේබලයේ නිශ්චිතව දක්වා ඇති විධානවලට අනුකූලව එහි දියරමය ස්වභාවය වෙනස් නොකොට සකස් කිරීම හෝ නැවත සකස් කිරීම කළ යුතු වන්නා වූ ද ; හෝ

(ආ) යම් ඝන හෝ අර්ධ ඝන ආහාරයක් පරිභෝජනයට පෙර, එකී ආහාරයේ බහාලුව මත ඇති ලේබලයේ නිශ්චිතව දක්වා ඇති විධානවලට අනුකූලව සකස් කොට හෝ නැවත සකස් කොට දියරමය ස්වභාවයට පත්කළ යුතු වන්නා වූ ද,

එසේ සකස් කිරීමෙන් හෝ නැවත සකස් කිරීමෙන් පසු එකී දියර හෝ ඝන හෝ අර්ධ ඝන ආහාරයේ සීනි අන්තර්ගත වන්නා වූ ද අවස්ථාවක, එම ආහාරයේ බහාලුව මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට ලේබල් කරනු ලැබිය යුතු ය.

(3) මේ නියෝගයේ සඳහන් යම් ආහාරයක් කලින් අසුරන ලද ආනයනික නිෂ්පාදනයක් වන අවස්ථාවක දී, එම ආහාරය අන්තර්ගත වන බහාලුව හෝ ඇසුරුම මත අතිරේක ලේබලයක් අලවා තිබිය යුතු අතර මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති ලාංඡන එම ලේබලයෙහි අන්තර්ගත විය යුතු ය.

3. (1) මේ නියෝගවල සඳහන් යම් ආහාරයක මෙහි උපලේඛනයෙහි I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති යම් සීනි ප්‍රමාණයක් අන්තර්ගත වන අවස්ථාවක දී, මෙහි උපලේඛනයෙහි II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති අනුරූප වර්ණයෙන් මෙහි උපලේඛනයෙහි III වන තීරයේ නිශ්චිතව දක්වා ඇති (මෙහි මින්මතු ''ලාංඡනය'' යනුවෙන් හඳුන්වනු ලබන) අනුරූප ලාංඡනයක් එම ආහාරය අන්තර්ගත වන බහාලුව හෝ ඇසුරුම මත ඇති ලේබලයෙහි තිබිය යුතු ය.

(2) මේ නියෝගවල (1) වන අනු නියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති ලාංඡනය පහත පරිදි සකස් කිරීම, නිර්මාණය කිරීම සහ ප්‍රදර්ශනය කිරීම කළ යුතු ය :-

(අ) ලාංඡනයේ උස සෙ.මී. 2 කට නොඅඩු විය යුතු අතර ලාංඡනයේ පළල සෙ.මී. 1 කට නොඅඩු විය යුතු ය ;

(ආ) (i) එම ආහාරයේ අන්තර්ගත ''සීනි'' ප්‍රමාණය පිළිබඳ විස්තරය මෙහි උපලේඛනයෙහි III වන තීරයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය. එම විස්තරය ඝන සුදු අකුරින් පිළිවෙළින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් ලාංඡනය තුළ ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු අතර එකී අකුරුවල ප්‍රමාණය අවම මි.මී. 2ක් විය යුතු ය ;

(ii) එම ආහාරයේ අන්තර්ගත සීනි ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යාත්මක විස්තරයක් මෙහි උපලේඛනයෙහි III වන තීරයේ පෙන්වා ඇති පරිදි සුදු කොටුවක් තුළ තිබිය යුතු අතර එය අවම මී.මී. 1.5ක ප්‍රමාණයේ ඝන කළු අකුරින් විය යුතු ය.

4. ලාංඡනය, එම ආහාරය අන්තර්ගත වන බහාලුව හෝ ඇසුරුම මත ඇති ලේබලයේ ප්‍රධාන රාමුවේ ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

5. මේ නියෝග ක්‍රියාත්මකභාවයට පත්වන වන අවස්ථාවේ දී සංසරණය වෙමින් පවතින වීදුරු බෝතල්වල මේ නියෝගවල සඳහන් යම් ආහාරයක් අන්තර්ගත වන අවස්ථාවක දී, 2024 මැයි මස 01 වන දින තෙක් එම ලාංඡනය එකී වීදුරු බෝතලේ ශීර්ෂයේ හෝ පියනෙහි ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

6. මේ නියෝගවල සඳහන් විධිවිධාන :-

(අ) මි.ලී. 100ක් සඳහා ග්‍රෑම් 0.5කට අඩු ප්‍රමාණයකින් ස්වභාවයෙන්ම පවතින සීනි අන්තර්ගත වන හෝ එකතු කළ සීනි අන්තර්ගත වන මේ නියෝගවල සඳහන් යම් ආහාරයක් ;

(ආ) බෝතල් කළ හෝ ඇසුරුම් කළ පානීය ජලය හෝ ස්වභාවික ඛනිජ ජලය ;

(ඇ) පැස්ටරීකරණය කරන ලද හෝ ජීවානුහරණය කරන ලද හෝ අධිතාපනයට (UHT) භාජනය කරන ලද යම් ප්‍රමිති කළ කිරි, අර්ධ වශයෙන් මේදය ඉවත් කළ කිරි, අඩු මේදය කිරි, මේදය ඉවත් කළ කිරි, මේද රහිත කිරි හෝ සකස් කළ කිරි (toned milk) ;

(ඈ) කුළුබඩු සහ කුළුබඩු මිශ්‍රණ, ආහාර ආකලන, රසකාරක ද්‍රව්‍ය, කළු තේ, හරිත තේ, කෝපි කුඩු, ඒක සංඝටක ඖෂධීය සාරය, මී පැණි, පැණි සහ ග්ලූකෝස් 100% ;

(ඉ) ළදරු ආහාර වට්ටෝරු (ආරම්භක), අනුගාමී ළදරු ආහාර වට්ටෝරු ;

(ඊ) විශේෂ පෝෂණ අවශ්‍යතා සඳහා භාවිතා කරනු ලබන යම් ආහාරයක් හෝ වෛද්‍ය උපදෙස් හෝ වෛද්‍ය වෘත්තිකයකුගේ නිර්දේශ මත භාවිත කළ යුතු බවට ලේබලයේ පැහැදිලිව ප්‍රදර්ශනය කර ඇති යම් ආහාරයක් ;

(උ) අපනයනය සඳහා පමණක්ම අසුරන ලද නිෂ්පාදන ;

(ඌ) මේ නියෝගවලට අනුකූළ වන්නා වූ සිල්ලර ඇසුරුම් අන්තර්ගත වන තොග ඇසුරුම් පිළිබඳව වන අවස්ථාවක දී එවැනි තොග ඇසුරුම් ; හෝ

(එ) මේ නියෝග ක්‍රියාත්මකභාවයට පත්වන දිනයට පෙර නිෂ්පාදනය කරන ලද, මේ නියෝගවල සඳහන් යම් ආහාරයක්,

සඳහා අදාළ නොවිය යුතු ය.

7. 2016 මැයි මස 3 වන දිනැති අංක 1965/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 ආහාර (සීනි මට්ටම සඳහා වර්ණ සංකේතවත් කිරීමේ) නියෝග, ඒ යටතේ නීත්‍යානුකූලව සිදුකරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ නියෝගවල -

"ඇම්බර්" යන්නෙන්, රතු, කොළ, නිල් (RGB) වර්ණ ක්‍රමයේ R255, G195 සහ B9, හෝ සමාන ක්‍රමයක අදාළ වර්ණ අදහස් වේ ;

"කොළ" යන්නෙන්, රතු, කොළ, නිල් (RGB) වර්ණ ක්‍රමයේ G195, හෝ සමාන ක්‍රමයක අදාළ වර්ණ අදහස් වේ ;

"ප්‍රධාන රාමුව" යන්නෙන්, සිල්ලර වෙළඳාම සඳහා වන ප්‍රදර්ශනය කිරීමේ පිළිගත් ක්‍රමවේදයක් යටතේ ප්‍රදර්ශනය කිරීමට, ඉදිරිපත් කිරීමට, පෙන්වීමට හෝ පරීක්ෂා කිරීමට බොහෝදුරට ඉඩ ඇති ලේබලයේ කොටස අදහස් වේ ;

"රතු" යන්නෙන්, රතු, කොළ, නිල් (RGB) වර්ණ ක්‍රමයේ R230, හෝ සමාන ක්‍රමයක අදාළ වර්ණ අදහස් වේ ; සහ

"සීනි" යන්නෙන්, මොනොසැකරයිඩ්ස් සහ ඩයිසැකරයිඩ්ස් ආකාරයෙන් ආහාරවල අන්තර්ගත වන මුළු සීනි ප්‍රමාණය අදහස් වේ.

**උපලේඛනය**

(3 වන නියෝගය)

| *I වන තීරය*<br>*අන්තර්ගත සීනි* | *II වන තීරය*<br>*වර්ණය* | *III තීරය*<br>*ලාංඡනය* |
|---|---|---|
| මි.ලී. 100ක ග්‍රෑම් 8.0 ට වඩා වැඩි | රතු |  |
| මි.ලී. 100ක ග්‍රෑම් 2.5 සිට ග්‍රෑම් 8.0 දක්වා | ඇම්බර් |  |
| මි.ලී. 100ක ග්‍රෑම් 2.5 ට වඩා අඩු | කොළ |  |

EOG 02 - 0152

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.